# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

### ශාස්ත්‍රවේදී පළමු වසර පරීක්ෂණය - (පළමු සෙමෙස්තරය) -2018/2019

### PSC - 1101 - දේශපාලන විද්‍යාව: හැඳින්වීමක්

**කාලය : පැ දෙකයි (02)**

ප්‍රශ්න <u>හතරකට ( 04 )</u> පමණක් පිළිතුරු සපයන්න.

එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය <u>**පහළොවකි (15).**</u>

---

01. "දේශපාලනය යනු බල අරගල පමණක් නොවේ." ඔබ මේ ප්‍රකාශය සමග එකඟ වන්නේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

02. බලය, අධිකාරය සහ සුජාතභාවය අතර පවත්නා සම්බන්ධය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

03. දේශපාලන විද්‍යාව ශාස්ත්‍රාලයීය ශික්ෂණයක් ලෙස පරිණාමය වූ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

04. දේශපාලනය හැදෑරීමේ විවිධ ප්‍රවේශ මොනවාදැයි පැහැදිලි කරන්න.

05. "දර්ශනය" යන්න නිර්වචනය කොට දේශපාලන දර්ශනයේ සුවිශේෂී ලක්ෂණ පැහැදිලි කරන්න.

06. නූතන ප්‍රජාතන්ත්‍රවාදී පාලනයන් තුළ දේශපාලන ආයතනවල භූමිකාව විවේචනාත්මකව අගයන්න.

07. පුරවැසිභාවය සහ සිවිල් සමාජය පිළිබඳ ලිබරල්වාදී අදහස විවේචනාත්මකව විමසන්න.

08. පහත සඳහන් තේමාවන් අතුරින් **දෙකක් (02)** පිළිබඳව සටහන් ලියන්න.
    (i) රාජ්‍යය සහ ආණ්ඩුව
    (ii) සමාජ සම්මුතිය
    (iii) දේශපාලනය සහ ස්ත්‍රී - පුරුෂ සමාජභාවය
    (iv) හෙජමොනිය

************************************